*සියළු ම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍ය ... ාපන කලාපය Gampaha Education Zone
ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Ed ... ucation Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍ය ... ාපන කලාපය Gampaha Education Zone
ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

**ගම්පහ අධ්‍යාපන කලාපය**
Gampaha Education Zone

## දෙවන වාර ඇගයීම - 2025
## Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / Grade: 7 | විෂයය / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | කාලය / Time: පැය 02 |

**සැලකිය යුතුයි.**

- **I කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

## I කොටස

- **අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරු වලින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- **පහත වාක්‍යවල ඉරි ඇඳි සාම්ප්‍රදායික යෙදුම්වලට ගැළපෙන අදහස තෝරන්න.**

01. නරක මිතුරන් සමග කිසිම **ඇයි හොඳයියක්** පැවැත්විය යුතු නැතැ'යි තාත්තා අපට කීවේ ය.
   1. සම්බන්ධයක්  2. තරහක්  3. සුහදතාවක්  4. විරුද්ධත්වයක්

02. ජනජය විද්‍යාලයට අලුත් විදුහල්පතිතුමා පැමිණීමත් සමග පාසලේ **නව එළියක්** ඇති විය.
   1. පරිහානියට පත්වීම  2. විදුලි ආලෝකයක්
   3. අලුත් දියුණුවක් ලැබීම  4. නවක සිසුන් පැමිණීම

03. ''වක්කඩේ හකුරු හැංගුව වගෙයි'' යන ප්‍රස්තාව පිරුළට සමීප අර්ථය වන්නේ,
   1. නිෂ්ඵල දෙයක් කිරීම  2. අනවශ්‍ය දෙයක් කිරීම.
   3. නොවිමසා කටයුතු කිරීම  4. සොරකමක් කිරීම

04. නිවැරදි අක්ෂර වින්‍යාසය යෙදී ඇති පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.
   1. දේශන - ප්‍රශ්ණ  2. සණ්ටාර - සම්මිශ්‍රණ
   3. අධිකරන - සංකීර්ණ  4. පිළිවෙළ - ශිෂ්‍යාචාරය

05. මහප්‍රාණ අක්ෂර පමණක් යෙදුණු පද පේළිය තෝරන්න.
   1. ය, ර, ල, ව  2. ස, හ, ට, ඩ  3. ක, ග, ජ, ට  4. ෂ, භ, ඨ, ධ

06. පහත සඳහන් වාක්‍යයේ හිස්තැනට ගැළපෙන වචනය වන්නේ,
   දරුවා දුවන විට වැටී ................ හිස තුවාල වී ඇඬුවේය.
   1. දණ  2. දන  3. ධණ  4. ධන

07. ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.
   1. දරුවෝ ගී ගයයි.  2. ඇත්තු ගස් පෙරළයි.
   3. ගොවියෝ කුඹුරු කොටති.  4. තාරකා අහසේ බබළති.

08. 'සිතේ හටගන්නා පසුතැවීම' යන්නට වඩා සුදුසු තනි පදය වන්නේ,

1. ප්‍රහේලිකාව 2. පශ්චාත්තාපය 3. කලකිරීම 4. කනගාටුව

- **කමත් බස අනුව පහත දැක්වෙන වචනවලට සමාන පද තෝරන්න.**

09. කලවිට

1. කෙත 2. බුලත් විට 3. කෙවිට 4. කමත

10. රසබෝය

1. තේ 2. හකුරු 3. පිදුරු 4. බැත

11. පහත මුලින් දී ඇති පදයට අදාළ විරුද්ධ පදය තෝරා යටින් ඉරක් අඳින්න.

අවමාන

1. අසමාන 2. විමාන 3. සම්මාන 4. නිර්මාණ

12. පිළිවෙළින් මුල් අකුරේ ඉස්පිල්ල, පාපිල්ල, ඇදය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

1. වියත, පැනය, රුවල 2. නිතර, රුවන්, සැකය

3. පින්න, කැටය, පුවරු 4. නිල්ල, කුසුම, පුළුන්

13. ''එම දූවිලි කුඩු <u>**පිඹ පිඹ**</u>

ඉහත කාව්‍ය පාදයේ ඉරි ඇඳි කොටසේ කාව්‍ය උපක්‍රමය වන්නේ,

1. එළිසමය යි. 2. උපමාවකි. 3. රූපකයකි. 4. අනුප්‍රාසය යි.

14. ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ මහතාගේ කාව්‍ය නිර්මාණ නිවැරදි ව දැක්වෙන පිළිතුර වන්නේ,

1. වැස්ස, සිනා කුමාරි, වෙසක් මිහිර
2. වෙසක් මිහිර, ඇත්ගාලේ දරුපෙම, මගේ රට
3. රාත්‍රිය, සේපාලිකා, මගේ රට
4. මගේ රට, වැස්ස, සිනා කුමාරි

- **පහත වාක්‍යයේ ඉරි ඇඳි ක්‍රියා පද වර්ගය තෝරා යටින් ඉරක් අඳින්න.**

15. ළමයි වතුර <u>**බී**</u> සෙල්ලම් කළ හ.

1. පූර්ව ක්‍රියා 2. මිශ්‍ර ක්‍රියා 3. විධි ක්‍රියා 4. ප්‍රයෝජ්‍ය ක්‍රියා

- **පහත 16 , 17 ප්‍රශ්නවල යොදා ඇති විරාම ලකුණු හඳුනාගෙන එහි විරාම නාමය යටින් ඉරක් අඳින්න.**

16. සිංහබාහු : කිම් ද මැණියනි ඔබ මේ පවසන වදනා

1. කොමාව 2. තිත් කොමාව 3. උඩු කොමාව 4. දෙතිත

17. ආර්ථික - සමාජ තත්ත්වය

1. කෙටි ඉර 2. තිත 3. ඇල ඉර 4. දෙතිත

- **පහත වාක්‍යයේ ඉරි ඇඳි පදය අයත් ව්‍යාකරණ විධිය තෝරා යටින් ඉරක් අඳින්න.**

18. <u>**යහපත්**</u> ළමයි මල් සේ ලොව සතුටු කරති.

1. මිශ්‍ර ක්‍රියා 2. නාම විශේෂණ 3. ක්‍රියා විශේෂණ 4. පූර්ව ක්‍රියා

19. ප්‍රථම වරට සිරිපා වන්දනා කරන්නට යන්නා..... යන නමින් හැඳින්වේ.

1. නඩේ ගුරා
2. කරුණාවන්තයා
3. පින්වන්තයා
4. කෝඩුකාරයා

20. දක්ෂ නිවේදකයකු සතු ගුණාංගයක් නොවන්නේ මින් කවරක් ද ?

1. අන්‍යයන්ට අවබෝධ වන පරිදි අදහස් ප්‍රකාශ කිරීම.
2. හඬ පාලනයෙන් යුතුව කතා කිරීම.
3. නිවැරදි ලෙස බස හසුරවමින් කතා කිරීම.
4. සවන් දෙන්නා පිළිබඳව අවබෝධයෙන් තොරව කතා කිරීම.

(ලකුණු 2x20 = 40)

## II කොටස

- **01 සහ 02 ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ.**
- **03, 04, 05, 06, 07 ප්‍රශ්නවලින් ප්‍රශ්න තුනක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

**1). ඔබ විසින් පන්ති කාමරයේ දී සකස් කරන ලද බිත්ති පුවත්පත ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i). බිත්ති පුවත්පත සඳහා ඔබ යෙදූ මාතෘකාව කුමක් ද ? (ල.02)

(ii). බිත්ති පුවත්පත සකස් කිරීමේ දී ගුරුතුමියගෙන් ලැබුණු උපදෙස් දෙකක් ලියන්න. (ල.02)

(iii). බිත්ති පුවත්පත සකස් කිරීමේ දී ඔබට මතුවූ ගැටලු දෙකක් ලියන්න. (ල.02)

(iv). බිත්ති පුවත්පත සකස් කිරීමේ දී කරුණු සොයාගත් මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ල.04)

(v). බිත්ති පුවත්පත සකස් කිරීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල.04)

(vi). බිත්ති පුවත්පතට ඔබ ඇතුළත් කළ නිර්මාණ අංගය කුමක් ද ? (ල.02)

(ල.16)

**2). පහත මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 කට නො අඩු රචනයක් ලියන්න.**

(i). අධ්‍යාපනය සාර්ථකත්වයට මාවතකි.

(ii). සුන්දර පරිසරයක් ගොඩනගමු.

(iii). පොදු දේපල සුරකිමු.

(iv). ලොවට තර්ජනයක් වූ විද්‍යුත් අපද්‍රව්‍ය

(v). ගැමි දිවියේ මිහිර

(ල.14)

3). ඔබ ප්‍රදේශයේ ව්‍යාප්ත වන මදුරු වසංගතය මර්දනය කිරීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලමින් ගම්පහ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා වෙත යැවීමට සුදුසු රාජකාරී ලිපියක් සකස් කරන්න. (ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් ඔබ යැයි සිතන්න.) (ල.10)

**4). පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ජලය පිළිබඳ සුප්‍රකට නියමයන් සොයා ගත් මහා විද්‍යාඥ ආකිමිඩීස් සිසිලි දූපතේ සයිරකියුස් නගරයේ උපත ලැබුවේ ක්‍රි.පූ. තුන්වැනි සියවසෙහි ය. යුද සොල්දාදුවෙකුගේ ප්‍රහාරයකට ලක්ව ඔහු මිය ගියේ ක්‍රි.පූ. 212 දී යැයි කියනු ලැබේ. ක්‍රි.පූ. තුන්වැනි සියවස ශ්‍රී ලංකාවේ සංස්කෘතික විප්ලවය ආරම්භය සිදු වූ වකවානුවයි. ආර්යයන් ලංකාවට පැමිණ ජනපද පිහිටුවා ගැනීමෙන් අනතුරුව මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කිරීමෙනි, මේ රට සංස්කෘතික විප්ලවයට මග පෑදුණේ, මහින්දාගමනය නිසා අනුරාධපුරයේ පමණක් නොව සමස්ත දිවයිනේ ම නව පිබිදීමක් ඇති විය. මහින්දාගමනය සිදුවන විටත් ලක්වැසියන් ජල කර්මාන්ත පිළිබඳ දැනුම ලබා සිටි බවට සාධක අනුරාධපුරයෙන් ලැබේ. දැන් බසවක්කුලම යන නමින් හැඳින්වෙන අභය වැව බඳවන ලද්දේ මහින්දාගමනයට පෙර ය. එහි නිර්මාතෘවරයා වූයේ පණ්ඩුකාභය රජතුමා ය. දැන් වැව් බැඳි රාජ්‍යය යන විරුද නාමයෙන් හැඳින්වෙන රජරට බඳින ලද ප්‍රථම වැව ලෙස මෙය සැලකිය හැකි ය.

1. ආකිමිඩීස් මහා විද්‍යාඥයාගේ නව සොයා ගැනීම නම් කරන්න.
2. ඔහු උපත ලද නගරය කුමක් ද ?
3. ශ්‍රී ලංකාවේ සංස්කෘතික විප්ලවයේ ආරම්භය සිදු වූයේ කිනම් සියවසක ද ?
4. මහින්දාගමනය සිදු වන විට ලක්වැසියන් ජල කර්මාන්තය පිළිබඳ දැනුම ලබා සිටි බවට සාධකයක් සඳහන් කරන්න.
5. රජරට හැඳින්වෙන විරුද නාමය ලියන්න.

(2 x 5 = 10)

**5). පහත දක්වා ඇති ප්‍රකාශවල අවස්ථා සම්බන්ධය ලියන්න.**

| ප්‍රකාශය | කවුරුන් විසින් | කා හටද ? |
|---|---|---|
| 1. ''යතුරු වී බිස්ස ළඟ එල්ලලා ඇති'' | | |
| 2. ''කෑ තලයට මිල එපයි; ඉනිබ්බේ මාගේ තල නොකන ලෙස අවවාද කියව'' යි කීහ | | |
| 3. ''ඇයි, ඉතින්, ගැලවෙන විදියක් ඔබ ම කල්පනා නොකරන්නේ ?'' | | |
| 4. ''මං හිතුවේ ඔයා ඔත්තුකාරියක් වෙන්න යනවා කියලා.'' | | |
| 5. ''නෑ මං කතා කළේ මල් පාත්තිය බලා ගන්න කියන්න.'' | | |

(2 x 5 = 10)

**6). පහත සඳහන් වාක්‍යවල ආඛ්‍යාත පද අතීත කාලයට හරවා ලියන්න.**

1. කම්මල්කරුවෝ ආයුධ තනති.
2. පුරාවිද්‍යාඥයා කරුණු අනාවරණය කරයි.
3. අපි මිහිරි හඬින් ගී කියමු.
4. අම්මා පුතුට කිරි පොවයි.
5. ගෙවිලිය වී පැදුර ගෙට ගනියි.

(2 x 5 = 10)

**7).** **සිලිලාරෙක හෙල් මැලී**

**පෙනි අතරින් සැලි සැලි**

**..................................................**

**..................................................**

(i). මෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(ii). 'සිලිලාර' යන්නෙහි තේරුම ලියන්න.

(iii). කවියා 'හෙල්මැලි' යනුවෙන් පවසන්නේ මොනවාට ද?

(iv). මෙම කවි පන්තිය කාගේ නිර්මාණයක් ද?

(v). මෙම පද්‍ය පන්තිය උපුටා ගත් පද්‍ය සංග්‍රහයේ නම කුමක්ද?

(2 x 5 = 10)